# 2022 අගෝස්තු මස 16 වන දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීම් වාර්තාව

දිනය සහ වේලාව :- 2022.08.16 පෙ:ව: 09.30

ස්ථානය :- ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

පැමිණීම:-

| | |
|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 08. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 09. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 11. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. එච්.පී. ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 17. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 19. එන්.එම්. නන්දාවතී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 20. ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

නොපැමිණීම:-

| | |
|---|---|
| 01. චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 02.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 03.ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සියලුදෙනා හා පැමිණ සිටි සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී.

සභා රැස්වීමට සහභාගීවූ සියල්ලෝම තම ආගම සිහිකර ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව මියගිය රණවිරුවන් හා මියගිය පළාත් පාලන ආයතන නියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් න්‍යායපත්‍රානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

## 01. පසුගිය සභා වාර්තාව සම්මත කර ගැනීම

2022 ජූලි මස 19 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ පිටු අංක 08හි සඳහන් මාගේ ප්‍රකාශයේ "අඩුපාඩු සකස්කර ඇත්නම් මුදල් ගෙවීම සුදුසුයි" වශයෙන් පමණක් සංශෝධනය විය යුතුයි.

ගරු සභාපතිතුමා

වෙනත් සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැතිනම් පසුගිය සභා වාර්තාව සම්මත කිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2022.07.19 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට මා විසින් යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

යෝජනා ස්ථිරත්වයෙන් අනතුරුව 2022.07.19 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - ඇත

01. 2022-06-13 වන දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී විවිධ උත්සව සඳහා රජයේ ආයතන විසින් රජයේ අරමුදල් වැය කිරීම සම්බන්ධව එළැඹි තීරණයේ සිංහල හා ඉංග්‍රීසි පිටපත් මා වෙත යොමු කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් ඉදිරිපත් කළ ලිපිය සභාගත කරමි.

02 . මධ්‍යම පළාත තුළ පිහිටි රජයේ ඉඩම් සඳහා 2022 වර්ෂයට අදාළව ඉංජිනේරු පිඹුර සකස් කිරීම වෙනුවෙන් මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව යටතේ එක් එක් දිස්ත්‍රික්ක සඳහා ලියාපදිංචි කරගන්නා ලද වර්ග මීටර 500 ඉක්මවන ඉඩම් සඳහා වට්ටම් ලබා දීමට එකඟ වී ඇත. ඒ අනුව ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව විසින් ලබා දී ඇති වට්ටම් සහිතව එකඟ වී ඇති මිළ ගණන් සඳහන් පළාත් පාලන කොමසාරිස් විසින් ඉදිරිපත් කළ ලිපිය සභාගත කරමි.

03. නිරිත දිග මෝසම සක්‍රීය වීම සමග ඇතිව තිබෙන අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් පළාත තුළ ඇතිවිය හැකි ආපදා තත්ත්වයන්ට මුහුණ දීම සඳහා පළාත් පාලන ආයතන සතුව පවතින යන්ත්‍රෝපකරණ සූදානම්ව තබාගන්නා ලෙසත්, දිස්ත්‍රික් ලේකම්වරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන් ආපදා තත්ත්වයන් කළමනාකරණය කරගැනීම සඳහා කරන ඉල්ලීම් කෙරෙහි අවධානය යොමු කරන ලෙසත් දන්වමින් පළාත් පාලන කොමසාරිස් විසින් ඉදිරිපත් කළ ලිපිය සභාගත කරමි.

04,පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කළ 2020 වර්ෂයට අදාළ පූර්ණ පරීක්ෂණ විමර්ශන නිලධාරී වාර්තාවේ අනු පිටපත සහිතව පළාත් පාලන කොමසාරිස් විසින් ඉදිරිපත් කළ ලිපිය සභාගත කරමි.

## 03. සභාවට ලැබී ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - නැත

## 04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත

### 05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 05:01:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින තාක්ෂණ නිලධාරී ඩබ්.එම්.මද්දුම බණ්ඩාර මහතාගේ සය මාසික කොන්ත්‍රාත් සේවා කාලය 2022.08.17 වන දින සිට අවසන් වන බැවින් සේවා අවශ්‍යතාවය සළකා 2022.08.18 දින සිට ඉදිරියට මාස 06ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නැවත සභා සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ජී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මධ්‍යම පළාත් සභාවේ පැවති රැස්වීමේදී කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන් සඳහා පළාත් සභාව මගින් වැටුප් ප්‍රතිපූර්ණය කිරීමේ අපහසුතාවයක් පැන නැගී ඇති බව දැනුම් දෙනු ලැබූ නමුත් සභාපතිවරුන් කියා සිටියේ මෙම නිලධාරීන් සේවයේ යෙදවීම යම්හෙයකින් නතර කළහොත් පළාත් පාලන ආයතන වලට විශාල ගැටළුවකට මුහුණපෑමට සිදුවනු ඇති බවයි. තාක්ෂණ නිලධාරීන්ගේ රාජකාරී වෙනත් නිලධාරීන් මගින් ආවරණය කරගත නොහැකි බැවින් කොන්ත්‍රාත් පදනමින් හෝ මෙම නිලධාරීන්ගේ සේවය ලබා ගතයුතුයි.දැනට සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින තාක්ෂණ නිලධාරී ඩබ්.එම්. මද්දුම බණ්ඩාර මහතාගේ සය මාසික කොන්ත්‍රාත් සේවා කාලය 2022.08.17 වන දින සිට අවසන් වන බැවින් සේවා අවශ්‍යතාවය සළකා 2022.08.18 දින සිට ඉදිරියට මාස 06ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නැවත සභා සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳ වෙනත් අදහසක් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

ඒ අනුව ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින තාක්ෂණ නිලධාරී ඩබ්.එම්.මද්දුම බණ්ඩාර මහතාගේ සය මාසික කොන්ත්‍රාත් සේවා කාලය 2022.08.17 වන දින සිට අවසන් වන බැවින් සේවා අවශ්‍යතාවය සළකා 2022.08.18 දින සිට ඉදිරියට මාස 06ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නැවත සභා සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

වල්ලහගොඩ ග්‍රාම නිලධාරී වසමේ හතුගොඩ,අස්වැද්දුම,පහළ කුඩමාකේ ,උඩරාමඩ යන ග්‍රාමයන්හි දුම්රිය මාර්ගයට යාබදව පවතින නිවෙස් සහිත ඉඩම්වලට දුම්රිය මාර්ගය හරහා ගමන් කිරීමට මාර්ගයක් සකස් කරදෙන ලෙස ගම්වාසීන් විසින් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීමට අනුව ප්‍රධාන දුම්රිය මාර්ගයේ කොළඹ සිට බදුල්ල දෙසට එනවිට වම්පසට වන්නට ඇති දුම්රිය මාර්ග රක්ෂිතයේ කෙළවරේ සිට දුම්රිය මාර්ගය දෙසට අඩි 08ක් පළල දුම්රිය රක්ෂිත ඉඩම් කොටස මැනුම් කිරීම සඳහා වැය වන රුː 25,729.76ක ඇස්තමේන්තු මුදල දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

වල්ලහගොඩ ග්‍රාම නිලධාරී වසමේ හතුගොඩ,අස්වැද්දුම,පහළ කුඩමාකේ ,උඩරාමඩ යන ග්‍රාමයන්හි දුම්රිය මාර්ගයට යාබදව පවතින නිවෙස් සහිත ඉඩම්වලට දුම්රිය මාර්ගය හරහා ගමන් කිරීමට මාර්ගයක් සකස් කරදෙන ලෙස ගම්වාසීන් විසින් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර තිබෙනවා. එම ඉල්ලීමට අනුව ප්‍රධාන දුම්රිය මාර්ගයේ කොළඹ සිට බදුල්ල දෙසට එනවිට වම්පසට වන්නට ඇති දුම්රිය මාර්ග රක්ෂිතයේ කෙළවරේ සිට දුම්රිය මාර්ගය දෙසට අඩි 08ක් පළල දුම්රිය රක්ෂිත ඉඩම් කොටස මැනුම් කිරීම සඳහා වැය වන රුː 25,729.76ක ඇස්තමේන්තු මුදල දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම ප්‍රදේශයේ සින්නක්කර ඉඩම්වල පදිංචි පවුල් ඒකක පහළොවක් පමණ මෙම මාර්ගය භාවිතා කරන අතර මෙම මාර්ගය ලබාදීම එම ප්‍රදේශවාසීන්ට පවතින දැඩි අවශ්‍යතාවයක් ඉටු කිරීමක් වශයෙන් දැක්විය හැකියි. එසේම මෙම ඉඩම් කොටස මැනුම් කළ පසු එම ඉඩම් කොටස වෙනුවෙන් අපට දීර්ඝකාලීනව දුම්රිය දෙපාර්තමේන්තුවට බදු ගෙවීමට සිදුවෙනවා. ඒ සඳහා ප්‍රථමයෙන් මැනුම් කර මාර්ගය නිරවුල් කරගැනීම සුදුසු බව මාගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය

ගරු සභාපතිතුමනි, මෙම ප්‍රදේශයේ විශාල පවුල් සංඛ්‍යාවක් වාසය කරන අතර මෙය බොහෝ කාලයක සිට පවතින ගැටළුවක්. ඔවුන්ගේ ගමනාගමන කටයුතු සඳහා විශාල දුෂ්කරතාවයක් පවතිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි, මැනුම් සඳහා මුදල් ගෙවා මාර්ගය සකස් කරදීම ප්‍රාදේශීය සභාවක් වශයෙන් අප සතු යුතුකමක් බව මාගේ අදහසයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

වල්ලහගොඩ ග්‍රාම නිලධාරී වසමේ හතුගොඩ, අස්වැද්දුම, පහළ කුඩමාකේ, ඌරාමඩ යන ග්‍රාමයන්හි දුම්රිය මාර්ගයට යාබදව පවතින නිවෙස් සහිත ඉඩම්වලට දුම්රිය මාර්ගය හරහා ගමන් කිරීමට මාර්ගයක් සකස් කරදෙන ලෙස ගම්වාසීන් විසින් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් කර ඇති ඉල්ලීමට අනුව ප්‍රධාන දුම්රිය මාර්ගයේ කොළඹ සිට බදුල්ල දෙසට එනවිට වම්පසට වන්නට ඇති දුම්රිය මාර්ග රක්ෂිතයේ කෙළවරේ සිට දුම්රිය මාර්ගය දෙසට අඩි 08ක් පළල දුම්රිය රක්ෂිත ඉඩම් කොටස මැනුම් කිරීම සඳහා වැය වන රුः 25,729.76ක ඇස්තමේන්තු මුදල දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව.9.50ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.

05:01:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

2022 වර්ෂයට අදාළ අයවැය ලේඛනයේ ප්‍රතිපාදන වෙන්කර ඇති යම් යම් වැය ශීර්ෂවල ප්‍රතිපාදන ඉක්මවා ගොස් ඇති බැවින් ප්‍රතිපාදන ඉතිරිව ඇති වැය ශීර්ෂ මාරු කර ප්‍රතිපාදන නොමැති වැය ශීර්ෂ සඳහා ප්‍රතිපාදන සළසා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 වර්ෂයට අදාළ අයවැය ලේඛනයේ ප්‍රතිපාදන වෙන්කර ඇති යම් යම් වැය ශීර්ෂවල ප්‍රතිපාදන ඉක්මවා ගොස් තිබෙනවා. මේ සම්බන්ධයෙන් පොදුවේ තීරණයක් ගැනීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

මූලාසනයේ ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මෙවැනි යෝජනාවක් සභාවට ඉදිරිපත් කරන විට කොපමණ ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරිව තිබෙනවාද කොපමණ වැය වී තිබෙනවාද යන්න පිළිබඳ විස්තරාත්මකව ඉදිරිපත් කළ යුතු බව මගේ අදහසයි. එවිට වැය ශීර්ෂ මාරු කෙරෙන වැය ශීර්ෂ මොනවාද යන්න පිළිබඳව සභාව දැනුවත් වෙනවා. එම නිසා එම විස්තරය පූර්වයෙන් ලබා දීම සුදුසුයි.

තීරණය

2022 වර්ෂයට අදාළ අයවැය ලේඛනයේ ප්‍රතිපාදන වෙන්කර ඇති යම් යම් වැය ශීර්ෂවල ප්‍රතිපාදන ඉක්මවා ගොස් ඇති බැවින් වැය ශීර්ෂ මාරු කර ප්‍රතිපාදන සළසා ගැනීම සඳහා අදාළ වැය ශීර්ෂ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.

06. යථාපරිදි කල්දී නොමැති යෝජනා /හදිසියෝජනා - ඇත

06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත කාය වර්ධන මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු සිදුකිරීම සඳහා පුහුණු උපදේශක තනතුරක් ඇති කිරීමට කටයුතු කරන ලෙස විමර්ශන නිලධාරී විසින් වාර්තා කර ඇත. ඒ අනුව කාය වර්ධන මධ්‍යස්ථානය සඳහා මුːරෙː 71 යටතේ පුහුණු උපදේශක තනතුරක් ඇති කිරීමට කටයුතු කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත කාය වර්ධන මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු සිදුකිරීම සඳහා දැනට සෞඛ්‍ය කම්කරු මහතෙකු යොදවා තිබෙනවා. කෙසේනමුත් එහි පුහුණු කටයුතු සඳහා ඊට ආළවම කායවර්ධන උපදේශකවරයෙකු බඳවා ගන්නා ලෙස දැනුම්දී තිබෙනවා. ඒ අනුව මු.රෙ.71 යටතේ පුහුණු උපදේශක තනතුරක් ඇති කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව ගරු මහා සභාවේ එකගතාවය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යොජනා කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත කාය වර්ධන මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු සිදුකිරීම සඳහා මුːරෙː 71 යටතේ පුහුණු උපදේශක තනතුරක් ඇති කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කසළ කැපීම වෙනුවෙන් යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලදි. ඒ අනුව වර්තමානයේ එම කසළ කපන යන්ත්‍රය සඳහා රුː669,680.00 ක මිළ ගණනක් ජිනසේන ඇග්‍රිකල්චරල් මැෂිනරි පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කර ඇත. මීට ප්‍රථමයෙන් කසළ කපන යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත මුදල් ගෙවූ නමුත් එම දෙපාර්තමේන්තුව විසින් එය ලබාදීම නතර කර ඇත. එම නිසා සේවා අවශ්‍යතාවය සළකා මෙම කසළ කපන යන්ත්‍රය රුː 669,680.00 ක මුදලකට ජිනසේන ඇග්‍රිකල්චරල් මැෂිනරි පුද්ගලික සමාගම වෙතින් මිළදී ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කසළ කැපීම සඳහා කසළ කපන යන්ත්‍ර දෙකක අවශ්‍යතාවයක් පවතී. දැනට ඇති එකම යන්ත්‍රය කැඩී ඇති බැවින් එය අලුත්වැඩියා කෙරෙමින් පවතිනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියයට පනහක දායකත්වය මත එක් කසළ කපන යන්ත්‍රයක් අප සභාව වෙත ලබා දීමට එකඟ වී සිටියද, රජය විසින් වර්තමානයේ වියදම් සීමා කිරීම හේතුවෙන් එම යන්ත්‍ර ගෙන්වීම නතර කර තිබෙන බව එම දෙපාර්තමේන්තව දැනවූවා. එම මුදල් නැවත සභාව වෙත ගෙවීමටද ඔවුන් එකඟ වී ඇත. එම නිසා එකී මුදල් ලබාගෙන වෙනත් යන්ත්‍රයක් මිළදී ගැනීමට කටයුතු කිරීම වඩා යෝග්‍ය බව මාගේ අදහසයි. මේ පිළිබඳව අදහසක් ඇතිනම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, මෙම මිළදී ගැනීමට විරුද්ධ නැති නමුත් පාරවල් ශුද්ධ කිරීම ආදී අත්‍යවශ්‍ය වැඩත් සිදුවිය යුතුයි. මෙම වැය කිරීම් සිදුකළ යුතුබව මගේ හැඟීමයි. එහෙත් පාරවල් ශුද්ධ කිරීම ,කඩා වැටී ඇති ඇලි ශුද්ධ කිරීම ආදිය සිදුකිරීමත් අත්‍යවශ්‍යයි. තැලිහුන්න ජනපද මාර්ගය දොළොස්බාගේ මාර්ගය ගමන් කළ නොහැකි ලෙස වල් වැවී තිබෙනවා. සභාවේ බැකෝලෝඩරය තිබියදී එම සම්පත් උපයෝගී කරගත යුතුයි. මේවාට වියදම් කරනවා වගේම අත්‍යවශ්‍ය කටයුතුත් සිදු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි, ඔබතුමා පැවසූ පරිදි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට එම යන්ත්‍රය මිළදි ගැනීම සඳහා ගෙවා ඇති මුදල් නැවත ලබාගැනීමට කටයුතු කිරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමා, එම මුදල් නැවත ලබා ගැනීමට කටයුතු කර තිබෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි, කසළ අංගනයට නැවත නැවත මුදල් යෙදවීම සම්බන්ධයෙන් අප දෙවරක් සිතිය යුතුයි. රසායනික පොහොර ගෙන්වීම ආරම්භ කර තිබෙනවා. එම නිසා දිගින් දිගටම මුදල් යෙදවීම අනවශ්‍ය වියදමක් විය හැකියි. අනවශ්‍ය ඉදිකිරීම්, වියදම් සම්බන්ධයෙන් මේ වකවානුවේ අප නැවත නැවත සිතීම සුදුසු බව මගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

ගරු සභාපතිතුමනි, දිගින් දිගටම කසළ අංගනය සුදු අලියෙක් වේයැයි කතා කරන්නට යෙදුණු බැවින් මා මෙහිදී කාරණා කිහිපයක් සිහිපත් කළ යුතුයි. ලොව දියුණු සහ දියුණුවෙමින් පවතින රටවල්වල කසළ ප්‍රතිචක්‍රීකරණය සහ කසළ කළමනාකරණය යන ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛ ස්ථානයක් ලබා දී තිබෙනවා. කසළ ව්‍යාපෘතිය සුදු අලියෙක් බවට පත්වීමට අවශ්‍ය කරුණු කිසිවක් මෙහි සිදුවී නැති බව මගේ හැඟීමයි.හිටපු ප්‍රාදේශීය සභා සභාපති ආනන්ද කුලතිලක මහතාගේ කාලයේ පටන් පැවති විශාල ගැටළුක් වශයෙන් කසළ කළමනාකරණය කිරීමේ ගැටළුව හඳුන්වා දිය හැකියි.දොළොස්බාගේ, උලපනේ ප්‍රදේශවල මෙම ගැටළුව තදබල ලෙස පැවති අතර හිටපු ප්‍රාදේශීය සභා සභාපති මහින්දරත්න අලුත්ගමගේ මහතා, හිටපු ප්‍රාදේශීය සභා සභාපති ගුණරත්න රාජපක්ෂ මහතා සහ හිටපු ගරු මන්ත්‍රීවරුන් මෙයට විසඳුම් සෙවීම සඳහා උත්සහ කරනු ලැබුවා. වාසනාවකට මෙන් ඔබතුමාගේ කාල පරිච්ඡේදය තුළ ප්‍රායෝගිකව හා න්‍යායාත්මකව මෙම කටයුත්ත සිදුකිරීමට හැකියාව ලැබුණි. මෙම සභාවේ සියලු ගරු මන්ත්‍රීවරුන්ට තම ධුරකාලය තුළ ගඟ ඉහළ කෝරළේ ජනතාවගේ කසළ ගැටළුවට විසඳුම් සොයා ගැනීමේ මාර්ගයකට පිවිසීමට හැකියාව ලැබීම පිළිබඳව සතුටු විය හැකියි. සියලු මන්ත්‍රීවරුන් මෙම කසළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා අගය කළ යුතු යැයි මා සිතනවා. එසේම ගම්පොළ නගර සභාවේ කසළවලට පවා යම් ප්‍රාමාණික විසඳුමක් අප ප්‍රාදේශීය සභාව මගින් ලබාදී තිබීම පිළිබඳව අප ආඩම්බර විය යුතුයි. නාගරීකරණය නිසා කසළ ගැටළුව උග්‍රවීම මිස කසළ ගැටළුව නිමා වේයැයි සිතා පූර්ව නිගමනවලට එළැඹීම අනවශ්‍යයයි. එම නිසා මෙම විෂයට ප්‍රමුඛස්ථානය

ලබා දියයුතු බව මගේ අදහසයි. සභාවේ ඇති අනෙකුත් අවශ්‍යතා සඳහා මුදල් යෙදවීම සමග කසළ කළමනාකරණය සම්බන්ධ කරගතයුතු නැති අතර එම ව්‍යාපෘතිය තවදුරටත් නවීකරණය කර දියුණු කළ යුතුයි.රසායනික පොහොර ගෙන්වූවත් යම් ප්‍රමාණයක් කාබනික පොහොර යොදා කෘෂිකාර්මික කටයුතු සිදුකෙරෙන නිසා කාබනික පොහොර සඳහා වන ඉල්ලුම පහළ යනු ඇතැයි සිතිය නොහැකියි. එම නිසා මෙම කසල කපන යන්ත්‍රය මිළදී ගැනීම සුදුසු බව මගේ අදහසයි.

<u>ගරු සභාපතිතුමා</u>

මේ ව්‍යාපෘතිය සඳහා සභා අරමුදලෙන් ලක්ෂ හතළිහක් පමණ වැය කර තිබෙනවා. මේවන විට රුපියල් කෝටියකට වඩා වැඩි වියදමක් දරා තිබෙනවා. අනෙක් ප්‍රතිපාදන රේඛීය අමාත්‍යංශයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලබා ගනු ලැබුවා. කසළ ව්‍යාපෘතිය විශාල සම්පතක්. හිටපු සභාපතිවරුන් දෙදෙනාගේ ධූර කාලයේදී මේ සඳහා ඉඩම ලබාගැනීමට කටයුතු කෙරුණු අතර ඒ සම්බන්ධව කටයුතු කළහිටපු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමන්ට සහ හිටපු සභාපතිවරුන්ට සහ යූ.අබේරත්න මැතිතුමාට ගෞරවණීය ස්තූතිය පුද කළ යුතුයි. මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

<u>තීරණය</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කසළ කැපීම වෙනුවෙන් සේවා අවශ්‍යතාවය සළකා රුː669,680.00ක මුදලකට පීනසේන ඇග්‍රිකල්චරල් මැෂිනරි පුද්ගලික සමාගම වෙතින් කසළ කපන යන්ත්‍රයක් මිළදී ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>06:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.</u>

ග්‍රාමීය මාර්ග වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල වැඩ අවසන් කර 2021 දෙසැම්බර් මස බිල්පත් ඉදිරිපත් කර ඇති නමුත් ඒ සඳහා ගෙවිය යුතු රුː 4,300,000.00ක ප්‍රතිපාදන මුදල් ගෙවීම මේවන තෙක් සිදුකර නොමැත. ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යංශය මගින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතින බව දන්වා ඇති හෙයින් එම කර්මාන්තවලට අදාළ මුදල් පසුව අප ප්‍රාදේශීය සභාව වෙත ප්‍රතිපූර්ණය කර දෙන තෙක් මෙම ව්‍යාපෘතිවලට අදාළ මුදල් ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ග්‍රාමීය මාර්ග අමාත්‍යංශයේ අධ්‍යක්ෂතුමියගෙන් මේ සම්බන්ධව කළ විමසීමේදී මෙම ව්‍යාපෘති සඳහා මහා භාණ්ඩාගාරයෙන් තවමත් මුදල් නිදහස් කර නොමැති බවත් හැකියාවක් ඇත්නම් සභා අරමුදලින් ගෙවීමට කටයුතු කරන ලෙසත් දැනුම් දී තිබෙනවා. ගෙවිය යුතු සම්පූර්ණ මුදල ලක්ෂ හතලිස් තුනකට අධික වන අතර ඒ සඳහා ගිවිසුම් අත්සන් කර ඇත්තේ ද සභාව මගිනි. කොට්ඨාසයක් සඳහා ලක්ෂ පහළොවක මුදලක් වෙන්කර ඇති බැවින් යම් කොට්ඨාසයක ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ඇත්නම් එම ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමට එම සභා අරමුදල් යොදාගත හැකියි. මේ සම්බන්ධව අදහස් ඇතිනම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව කාලීන යෝජනාවක් සේම මූල්‍යමය අර්බුධයක් පවතින අවස්ථාවක මෙය ගැටළුවක් වශයෙන් ද දැක්විය හැකියි. ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුම්ගත වී ඇති නිසා එම මුදල් අනිවාර්යයෙන්ම ගෙවිය යුතුයි. යම් හෙයකින් කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වැඩ අවසන් කර බිල්පත් ඉදිරිපත් කළහොත් ගෙවීමට සභාවේ මුදල් තිබිය යුතුයි.ඒ සඳහා සභාවක් වශයෙන් අපි වගකීමට බැඳී සිටිය යුතුයි. 2022 වර්ෂය සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන වශයෙන් වෙන්කර ඇති මුදල් වෙනත් අමාත්‍යංශයක ප්‍රතිපාදන මගින් සිදුකෙරුණු ව්‍යාපෘති සඳහා හිලව් කිරීම සුදුසු නොවන බව මගේ අදහසයි. එසේම දැනට වැඩ අවසන් කර බිල්පත් ඉදිරිපත් කරන ලද නමුත් මුදල් ලැබී නොමැති සියලු ව්‍යාපෘති පිළිබඳව සහ දැනට පවතින මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවක් මුදල් කමිටුවට ඉදිරිපත් කර අනතුරුව සභාවට ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසුය යන්න මගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා

ගරු සභාපතිතුමනි, අදාළ අමාත්‍යංශය දැනුවත් කර මුදල් ග්‍රාමීය මාර්ග අමාත්‍යංශයෙන් ම ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යංශය මගින් ක්‍රියාත්මක කළ වැඩ අවසන් කර ඇති ව්‍යාපෘතිවල මුදල් ඒ ප්‍රාදේශීය සභා අරමුදලෙන් ගෙවීම සුදුසු නොවන බවටත් එම මුදල් ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යංශයෙන් ප්‍රාදේශීය සභාව වෙත ලැබුණු පසුව ගෙවීම් කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදී.

06:04 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

පළාත් පාලන අමාත්‍යශයේ සහ ශ්‍රීධරන්පුර රණවිරු ප්‍රජා ජල සමිතියේ මූල්‍ය ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද ශ්‍රීධරන්පුර ප්‍රජා ජල ව්‍යාපෘතියේ සියයට අනූපහක් පමණ වැඩ අවසන් වී ඇති අතර ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිමකර ජල සැපයුම ලබාදීම ,බෙදාහැරීම හා නඩත්තුව සඳහා ජල ව්‍යාපෘතිය ප්‍රාදේශිය සභාවට හෝ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පවරා ගන්නා ලෙස එම සමිතිය ඉල්ලීම් කර ඇත. ඒ අනුව ප්‍රාදේශීය සභාවට හෝ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පවරාගෙන ඉදිරි කටයුතු සිදුකිරීම සුදුසු බව ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා

ගරු සභාපතිතුමනි, ප්‍රජා ජල සමිතියේ සහ අප සභාවේ අරමුදල් යොදවා ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියේ දැනට සියයට අනූපහක් පමණ වැඩ අවසන් වී තිබෙනවා. මෙම ඉල්ලීම සිදුකර තිබෙන්නේ ඉදිකරන ලද ජල ටැංකි සඳහා ජල සම්පාදන මණ්ඩලයෙන් ජල සැපයුම ලබා දී ඇතත් එම ටැංකිවලින් ජලය බෙදා හැරීමේ ජල නළ පද්ධතිය සකස්කර නිවාස සඳහා ජල සැපයුම ලබාදීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සමිතිය සතුව නොමැති බැවිනි. මෙම ව්‍යාපෘතිය ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පවරාගෙන කටයුතු කරගෙන යාමට කැමැත්ත පළ කර ඇතත් මෙහි ඉදිකිරීම්

කටයුතු අවසන් කොට නොමැති බැවින් නිශ්චිත විසඳුමක් ලබා ගැනීමට කටයුතු කළයුතුව පවතිනවා. මේ දිනවල ශ්‍රීධරන්පුර ජනතාවට ජල ගැටළුව ඉතා තදින්ම බලපා ඇති බැවින් ජල සැපයුම ලබා දීම, බිල්පත් නිකුත් කිරීම හා නඩත්තු කටයුතු කරගෙන යාමට සභාවට හෝ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පවරාගෙන ඉක්මණින් ඉතිරි කටයුතු අවසන් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

නීත්‍යානුකූලව මෙම ජල ව්‍යාපෘතිය ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පවරා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයා බැලිය යුතුයි.ඉන් පසු ජලාපවාහන මණ්ඩලය සමග සාකච්ඡා කර මේ සඳහා තීරණයක් ගත යුතු බව මගේ අදහසයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා</u>

ගරු සභාපතිතුමනි, සභාවෙන් මේ සඳහා වියදම් කර ඇත්නම් ජාතික ජල සම්පාදන මණ්ඩලයට පවරා දීම සුදුසු නොවන බව මගේ අදහසයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා</u>

ගරු සභාපතිතුමනි, ඉදිරියේදී ජල බිල එකට තුනක් වශයෙන් වැඩි වීමට නියමිතයි.එසේ වැඩි වුවහොත් යම් ගැටළුවක් ඇති විය හැකියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි, ගුරුගේ මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ඉක්මණින් ක්‍රියාත්මක කළ යුතු යැයි මා සිතනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමග සාකච්ඡා කර මේ සඳහා තීරණයක් ගත යුතු බව මගේ අදහසයි.

<u>ගරු සභාපතිතුමා</u>

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

<u>තීරණය</u>

පළාත් පාලන අමාත්‍යංශයේ සහ ශ්‍රීධරන්පුර රණවිරු ප්‍රජා ජල සමිතියේ මූල්‍ය ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද ශ්‍රීධරන්පුර ප්‍රජා ජල ව්‍යාපෘතියේ සියයට අනූපහක් පමණ වැඩ අවසන් වී ඇති අතර ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිමකර ජල සැපයුම ලබාදීම, බෙදාහැරීම හා නඩත්තුව සඳහා ජල ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාවට හෝ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පවරා ගන්නා ලෙස කර ඇති ඉල්ලීමට අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමග සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකිරීම සුදුසු බව ගරු මහා සභාව තීරණය කරන ලදී.

<u>06:05 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.</u>

පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වැටකේදෙණිය ප්‍රධාන මාර්ගය වාහන ගමන් කළ නොහැකි පරිදි දැඩි ලෙස අබලන් වී ඇති බැවින් ප්‍රදේශවාසීන් දැඩි දුෂ්කරතාවයකට මුහුණ පා ඇත. මෙම මාර්ගය සඳහා නඩත්තු කටයුත්තක් සිදුකිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා</u>

ගරු සභාපතිතුමනි, මා දන්නා ආකාරයට නාවලපිටිය ආසනයේ සංවර්ධනය නොවූ එකම මාර්ගය මෙම වැටකේදෙණිය මාර්ගය පමණයි. පාසල් ගුරුවරු හා පාසල් ළමුන් විශාල වශයෙන් මේ මාර්ගය භාවිතා කරන අතර ත්‍රී රෝද රථ කුලී වශයෙන් රුපියල් දහසක් පමණ ගෙවා මෙම මාර්ගයේ ඔවුන් ගමන් කළයුතුයි. ප්‍රදේශයේ දෙසීයකට අධික ජනතා සහභාගීත්වයෙන් මාර්ගයේ අසීරුම කොටස පිළිසකර කරගනු ලැබූ නමුත් ඉතිරි කොටස අලුත්වැඩියා කිරීම ඉතාම අත්‍යවශ්‍ය වී තිබෙනවා. එසේම ප්‍රදේශයේ මන්ත්‍රීවරයා වශයෙන් මේ සම්බන්ධයෙන් මා දැඩි දෝෂදර්ශනයට ලක්වී තිබෙනවා. පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාට කිහිපවරක් දැනුම් දුන්නත් මෙම කාර්යය තවමත් සිදුවුණේ නෑ. ගමේ ජනතාවගේ ගැටළු විසඳාදීමට ප්‍රාදේශීය සභාවට පත් කොට යැවූ මන්ත්‍රීවරයා වශයෙන් මාගෙන් ඔවුන් බලාපාරොත්තු වෙනවා. ප්‍රාදේශීය සභා විෂය පථයට අයත් නොවූවත් මේ සඳහා විසඳුම් ඔවුන් අපේක්ෂා කරනවා. වැටකේදෙණිය දක්වා යැයි කියූ කාපට් ඇතිරූ මාර්ගය ගැමුණුපුර ප්‍රදේශයෙන් නතර වී තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාටත් මේ සම්බන්ධයෙන් ක්‍රියා කළ හැකි සීමාවක් ඇති බව මා දන්නවා.නමුත් වගකිවයුතු ආයතනයකට දැනුම් දී මාර්ගයේ පවතින වළවල් වසා මාර්ගය සකස්කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා</u>

හිටපු ගරු කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමඟ සාකච්ඡා කර, සංවර්ධන කටයුතු සිදුවිය යුතු මාර්ග සම්බන්ධයෙන් විසඳුම් ලබා ගැනීමට කටයුතු කරනු ලැබූ නමුත් යම් ගැටළුවක් මතුවී මෙම වැටකේදෙණිය මාර්ගයේ ගැටළුව පමණක් විසඳුනේ නැහැ. ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපට මෙම මාර්ගය පිළිසකර කිරීම සඳහා මුදල් යෙදවිය නොහැකි බැවින් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් මෙම කාර්යය සිදුකර ගැනිමට කටයුතු කිරීම සුදුසුයි.

<u>ගරු සභාපතිතුමා</u>

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

<u>තීරණය</u>

පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වැටකේදෙණිය ප්‍රධාන මාර්ගය දැඩි ලෙස අබලන් වී ඇති බැවින් එම මාර්ගයේ වළවල් වසා මාර්ගය සකස් කිරීම සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.

<u>07 කාරක සභා වාර්තා සළකා බැලීම</u>

<u>07:01 මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව</u>

2022.08.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි. ඒ අනුව 2022 වර්ෂයට අදාළ ආදායම් වියදම් පුරෝකථනයද, 2022 ජූලි මස මුළු ලැබීම් රු:15,108,248.31ක්ද මුළු වියදම රු:7,691,778.07 ක්ද විය. 2022 ජූලි මසට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශය 2022.08.08 වන දින මහනුවර විගණන අධිකාරී වෙත යොමුකර ඇත.

08.සභාවේ මාසික ලැබීම් හා ගෙවීම් වාර්තාව

2022.08.04 සිට 2022.08.09 දක්වා ගෙවීම් වාර්තාව සභාගත කරන ලදී.

| අනු අංකය | දිනය | ආදයකයා | ගෙවීම් විස්තරය | වවුචර් අංකය | හරස් සටහන් | මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | 2022-08-04 | ඩබ්.එම්.එම් බණ්ඩාර මයා (කොන්ත්‍රාත් - තාක්ෂණ නිලධාරි ) | 2022 ජූලි මස සේවක වැටුප් ගෙවීම. | 830 | 25.00 | 61,903.00 |
| 2 | | නාවලපිටිය ඔටෝ කෙයාර්, නාවලපිටිය | CPPF 7455 කැබ්රථයේ ඉදිරිපස සොකට් ෂෝබර් දෙක අලුතින් දැමීම වෙනුවෙන් නාවලපිටිය ඔටෝ කෙයාර් වෙත මුදල් ගෙවීම | 831 | | 91,375.00 |
| 3 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | කුරුඳුවත්ත ජල පොම්පාගාරයේ 2022 ජූලි මස විදුලි බිල්පත ගෙවීම. | 832 | | 4,284.30 |
| 4 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | උලපනේ ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ 2022 ජූලි මස විදුලි බිල්පත ගෙවීම. | 833 | | 569.40 |
| 5 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | 2022/08/03 දින කව්දු බිල්ඩර්ස් වෙතින් කළ ඉල්ලීම අනුව කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය අදියර 01 ඉදිකිරීම් ස්ථානයට නැවත විදුලිය ලබා ගැනිම සඳහා ගෙවීම.( විදුලිය නැවත ලබාගැනිම සඳහා රු.3000.00 ගෙවීමට හිඟව පැවති මුදල රු.1440.00) | 834 | | 4,440.00 |
| 6 | | කේ.ආර්.දිමුතු මධුසංක කලංසූරිය මයා - ඊ නැණ පියස පරිගණක උපදේශක | 2022 ජූලි මස ඊ නැණ පියස පරිගණක උපදේශක දීමනාව ගෙවීම. | 835 | | 30,000.00 |
| 7 | | ඊ.ඩබ්.පී.විජේරත්න මයා- සෞඛ්‍ය කම්කරු | නිවසේ අලුත්වැඩියා කටයුත්තක් සඳහා ආපදා ණය ගෙවීම. | 836 | 25.00 | 44,975.00 |
| 8 | | එන්.යු.පී.ඊ.එස්.විමලරත්න මයා කුරුඳුවත්ත | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශයට සනීපාරක්ෂක භාණ්ඩ ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 837 | | 20,840.00 |
| 9 | | දවස මධ්‍යස්ථානය ගම්පොළ | ඇත්ගාල මහජන පුස්තකාලයේ 2022 ජූනි මාසයට මිලදිගත් පුවත්පත්වල බිල්පත ගෙවීම. | 838 | | 5,990.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඩීසල් වාහන සඳහා දැල්පිටිය ඩිපෝව මගින් ඩීසල් ලීටර් 200ක් ලබා ගැනිමට මුදල් ගෙවීම. | 839 | | 86,000.00 |
| 11 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | උලපනේ කසල මධ්‍යස්ථානයේ දෛනික පදනම මත සේවයේ යෙදෙන සෞඛ්‍ය කම්කරුවන් සඳහා 2022 ජූලි මස වැටුප් ගෙවීම. | 840 | | 110,394.92 |
| 12 | 2022-08-09 | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඩීසල් වාහන සඳහා නාවලපිටිය ඩිපෝව මගින් ඩීසල් ලීටර් 200ක් ලබා ගැනිමට මුදල් ගෙවීම. | 841 | | 43,000.00 |
| 13 | | ඩී.එම්.එල්.බණ්ඩාර මයා සංවර්ධන නිලධාරි | ඇත්ගාල ස.තො.ස. ආයතනය පිටුපස ඇති පොදු වැසිකිලියේ වල උතුරා යාම නිසා එය වෙනත් වලකට හැරවීමට කම්කරුවකු යෙදීම සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 842 | | 3,500.00 |
| 14 | | බී.පී.මිල්ටන්රත්න මයා - මාර්ග කම්කරු | 2022 - ජූනි මස අතිකාල දීමනා ගෙවීම (පැය 19.42) | 843 | | 2,072.30 |
| 15 | | කේ.පි ක්‍රිශාන්ත සමන්සිරි මයා - මාර්ග කම්කරු | 2022 - ජූනි මස අතිකාල දීමනා ගෙවීම (පැය 28.30) | 844 | | 2,998.10 |
| 16 | | එම්.පී.සිසිර කුමාර මයා- වැඩ මූලික | 2023 - ජූනි මස අතිකාල දීමනා ගෙවීම (පැය 24.58) | 845 | | 2,626.30 |
| 17 | | එම්.පී.සිසිර කුමාර මයා- වැඩ මූලික | 2024 -මැයි මස අතිකාල දීමනා ගෙවීම (පැය 25) | 846 | | 2,630.00 |
| 18 | | ආර්.එම්.ඉනෝකා සෙනෙවිරත්න මිය- මැහුම් උපදේශිකා | 2022 ජූලි මාසයේ වැටකේදෙණිය විහාරස්ථාන ධර්ම ශාලාවේ 2022/07/05,12,18 සහ 26 දිනවලදි හා ගල්පාය විහාරස්ථානයේදි 2022/07/04,6,14,19 සහ 27 දිනවලදි පැවැත් වූ මැහුම් පාඨමාලා සඳහා ගෙවීම් කිරිම | 847 | | 20,000.00 |
| 19 | | එම්.පි.දර්ශන බණ්ඩාර ධර්මරත්න මයා- කුරුඳුවත්ත | 2022/07/12 වන දින පැවති මුදල් කමිටුව සහ අනෙකුත් කමිටු රැස්වීම් සඳහා තේ පැන් සංග්‍රහ කිරිම වෙනුවෙන් වැය වූ මුදල් ගෙවීම. | 848 | | 2,160.00 |
| 20 | | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය | 2022 වර්ෂයේ ජූලි මසට අදාල භූමි පර්යේෂණ ගාස්තු ගෙවීම. | 849 | | 675.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **21** | | ගොඩකුඹුර කොමියුනිකේෂන්- කුරුඳුවත්ත | කුරුඳුවත්ත මහජන පුස්තකාලයේ 2022 ජූලි මස පුවත්පත් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල, හිඟ කඩකුලි සඳහා හිලව් කිරීම | 850 | | **5,550.00** |
| | | එකතුව | | | **50.00** | **545,983.32** |

09. වෙනත්

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය දානමය කටයුත්තක් හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

එම නිවාඩු ඉල්ලීම අනුමත කරන ලදි.

02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතා අධිකරණ කටයුත්තක් සඳහා සහභාගී වීම සඳහා අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

එම නිවාඩු ඉල්ලීම අනුමත කරන ලදි.

03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. චාමික අනුරාධ රත්නායක මහතා අසනීපවීම හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

එම නිවාඩු ඉල්ලීම අනුමත කරන ලදි.

04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි, අප බල ප්‍රදේශයේ සවිකර ඇති වීථි ලාම්පු බොහොමයක විදුලි බල්බ අක්‍රිය වී තිබෙනවා. එම බල්බ මිළදී ගැනීමේදී අදාළ ආයතනවලින් වගකීම් සහතික නිකුත් කරන අතර එම වගකීම් කාලය වසර දෙකක් තුනක් පමණ විය යුතුයි. එම නිසා සභාවේ විදුලි කාර්මික මහතා ලවා මෙම අක්‍රිය වී ඇති විදුලි බල්බ පරීක්ෂා කර බලා එම බල්බවල වගකීම් කාලය ඉකුත් වී නොමැති නම් මාරු කිරීමටත් අනෙක් බල්බ මාරු කර අලුතින් සවි කිරීමටත් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. අප සභාවෙන් වීථි ලාම්පු සවි කිරීම නිසා ගමට ආලෝකයක් ලැබුණු අතර ලබා දුන් පහසුකම් නැතිවී යාමට ඉඩ නොතැබිය යුතුයි.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සිහිපත් කළේ ඉතා වැදගත් කාරණයක්. මේ දිනවල පවතින ඉන්ධන ගැටළුව නිසා වාහන යොදා ගැනීමේදී වඩා අරපිරිමැස්මෙන් කටයුතු කෙරෙනවා. ඉනිමග සහ අනෙකුත් උපකරණ ප්‍රවාහනය කිරීමට හැකියාවක් පැවතිය යුතුයි. හැකියාවක් ලද විගස මේ විදුලි බල්බ පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු කරනවා.

05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

ගරු සභාපතිතුමනි, දොළොස්බාගේ නගරයේ ප්‍රජා ජල ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීම සම්බන්ධයෙන් සාධනීය විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. එසේම නගරයේ ඇති වැසිකිළියේ බැම්ම ගරා වැටී තිබෙන බැවින් තාක්ෂණ නිලධාරී මහතා මගින් මේ සම්බන්ධව ස්ථානීය පරීක්ෂාවක් සිදුකර එය අලුත්වැඩියා කර දෙන මෙන් ඉල්ලා සිටිමි.

ගරු සභාපතිතුමා

ගෞරවනීය ස්වාමීන්වහන්සේ, ඔබවහන්සේගේ ජලනළ තිබෙනවා නම් ඒවා අපට ලබා දෙන්න. ඒවා මගින් ජලය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳව මට තනිව පිළිතුරු ලබා දීමට හැකියාවක් නැහැ. ප්‍රජා ජල සමිතිය සමඟ සාකච්ඡා කර විසඳුමක් ලබා ගනිමු.

06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, කුරුඳුවත්ත අවට ව්‍යාපෘති පරීක්ෂා කිරීම සඳහා පැමිණි පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ඩීසල් ලීටර් කොපමණ ප්‍රමාණයක් ලබා දුන්නාද යන්න පිළිබඳව සහ ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයට අයත් සුසාන භූමි මැණුම් සිදුකර ඔප්පු නිරවුල් කර ගැනීම සම්බන්ධයෙන් සභාවට තොරතුරු ඉදිරිපත් කරන බවට ඔබතුමා පොරොන්දු වුනා. ඒවා අපට ලැබුණේ නෑ. තව සුසාන භූමි කොපමණ ප්‍රමාණයක් මැන නිරවුල් කර තිබෙනවාද යන්න පිළිබඳවත් ගරු මහා සභාවට කොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

එම නිලධාරීන් මෙම ස්ථානයට පැමිණ අදාළ ඉදිකිරීම් පරීක්ෂා කිරීම සඳහා යාමට ඉන්ධන නොමැති බව දැනුම් දුන් නිසා වරකට ඩීසල් ලීටර් දහය බැගින් ලබා දෙනු ලැබූ අතර එම නිලධාරීන් සඳහා ගාස්තු ගෙවීම් සිදුකිරීමේදී මෙම ඉන්ධන සඳහා වැය වූ මුදල නැවත අය කරගත හැකියි. ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයට අයත් සුසාන භූමි මැණුම් සිදුකර ඔප්පු නිරවුල් කර ගැනීම සම්බන්ධයෙන් වැඩ කටයුතු සියයට අනූවක් වැඩ අවසන් වී තිබෙනවා. ඒ සම්බන්ධව ලේකම්තුමියට සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරි මහා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා සිටිනවා.

07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා

ගරු සභාපතිතුමනි, උලපනේ පොදු වැසිකිළිය සහිත භූමිය දැනට වෙනත් අයෙකු අත්පත් කරගෙන සිටිනවා. ඒ පිළිබඳවත් සොයා බලා අවශ්‍ය කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමා, එම ඉඩම සමිතියකට ලබා දෙන බව ඔබතුමා පැවසුවා. ඊළඟ සභා වාරයට ඔබතුමා ඊට අදාළ යෝජනාව ඉදිරිපත් කරන්න.

ගරු සභාපතිතුමා

අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්තවන බව ප්‍රකාශ කරන ලදි. අද දින සභාවාරය සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලුදෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 12.30 ට අවසන් කරන ලදි.

සභාපති

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2022.08.16 වන දින ගඟ ඉහළ කෝරළේ

ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදීය